**ශීර්ෂය 149- කර්මාන්ත අමාත්‍යාංශය**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

කර්මාන්ත අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

**(අ) දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ------------------------------ |
| (අ) | භාණ්ඩාගාර මුද්‍රිතය අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්හි මුළු වටිනාකම රු.1,652,136,442ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය රු.1,671,411,554ක් වීමෙන් රු.19,275,111 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් ඇතුළත් කළ යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් 2020 අවසාන ගිණුම් සාරාංශය මගින් බැර කරන ලද රු.19,275,111 ක වටිනාකම නිසා භාණ්ඩාගාර පොත් අනුව අඩුවීමක් වාර්තා ගතවී ඇති බව. |
| (ආ) | අමාත්‍යාංශ පුස්තකාලයෙහි පවතින පොත් වටිනාකම අගය කර වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | අමාත්‍යාංශය සතු වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. | කඩිනමින් කමිටුවක් පත් කර අදාල වටිනාකම තක්සේරු කර වත්කමක් ලෙස ගිණුම් ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ඇ) | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ රු.18,940,000 ක් වටිනා මෝටර් රථ 3ක කල්බදු ගිවිසුම 2020 දෙසැම්බර් 31 දින වන විට අවසන්ව තිබුණද එය වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අමාත්‍යාංශය සතු වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. | පවරා ගැනීමට අදාල ඉදිරි කටයුතු කර එම වාහන අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ඈ) | කර්මාන්ත අමාත්‍යාංශය නමින් ලියාපදිංචි රු.13,400,000 ක වටිනාකමැති මෝටර් රථ 3ක් වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | අමාත්‍යාංශය සතු වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. | ඉදිරියේදී ඒ පිළිබඳ සොයා බලා වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. |
| (ඉ) | අමාත්‍යාංශය විසින් වැය දරා ඉදිකරන ගොඩනැගිලි වටිනාකම එහි මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළ යුතු වුවත් 1997 වර්ෂයේ සිට කර්මාන්තපුර 30ක | ප්‍රාග්ධනිත වියදම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. | අමාත්‍යාංශය මගින් වෙනත් රජයේ කාර්යාලයකට අයත් ඉඩමක කර්මාන්ත පුර ඉදිකරන අතර එහි පිවිසුම් මාර්ග, කාණු පද්ධති, වීදි ලාම්පු, මාර්ග |

| | | |
|---|---|---|
| ඉදිකළ පරිපාලන ගොඩනැගිලි 14ක වටිනාකම වූ රු. මිලියන 105.878 ක ප්‍රමාණය අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | පද්ධති ආදී ඉදිකිරීම්ද සිදු කරනු ලබයි.<br>එක් එක් කර්මාන්තපුර අයත් වන රජයේ කාර්යාල සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගෙන ඉදිරියේදී එම වත්කම් අමාත්‍යාංශයේ වත්කම් ලෙස හෝ අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු යොදන බව. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස රු.45,298,859 ක් සටහන් කර තිබූ අතර භාණ්ඩාගාර මුද්‍රිතය අනුව එය රු.34,729,454.01ක් විය. ඒ අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.10,569,405ක් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(ආ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.27,597,007 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිතය අනුව අනුව එය රු.52,431,306.34 විය. ඒ අනුව රු.24,834,299ක් වූ අත්තිකාරම් ගෙවීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අඩුවෙන් සටහන් කර තිබුණි. | ගිණුම් වලට ඇතුළත් කළ යුතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රතාශන පිළියෙල කළ යුතුය. | වර්ෂය අවසානයේ නියමිත පරිදි අයවැය ඇස්තමේන්තු අනුමත වීමෙන් අනතුරුව භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් හා අයවැය දෙපාර්තමේන්තු උපදෙස් පරිදි (ශීර්ෂ අංක 149) මෙම අමාත්‍යාංශයට අදාල ලැබීම් හා ගෙවීම් වටිනාකම් එම වැය ශීර්ෂයෙහි රැඳෙන පරිදි **CIGAS** පරිගණක වැඩසටහන මගින් අවශ්‍ය ගැලපීම් සිදුකර ඇත. මාසිකව මෙම අමාත්‍යාංශයට අදාල ලැබීම් හා ගෙවීම් අදාල භාණ්ඩාගාර ශේෂ අනුව මාසිකව සසඳමින් ලබා ගන්නා ලද වටිනාකම් අනුව 2020 අවසාන ගිණුම් සකස් කර ඇති බව. |

### 1.6.3 අක් මුදල් ගැලැපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අක්මුදල් ගැලපුම් ගිණුම අනුව මු.රෙ.208 යටතේ වෙනත් අමාත්‍යාංශ ප්‍රධාන ලෙජර දරණ වියදම් රු.828,973,502 ක් වුවද භාණ්ඩාගාර පොත්/ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.828,105,552 ක් වීමෙන් රු.867,950 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි වටිනාකම් ඇතුළත් කර අක් මුදල් ගැළපුම් ගිණුම පිළියෙල කළ යුතුය. | අමාත්‍යාංශයේ විෂය පථය සහ ඒ සඳහා වෙන්වූ වැය ශීර්ෂ අංකය භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන ලද පැහැදිලි උපදෙස් අනුව යමින් මෙම වැය ශීර්ෂයට අදාල වියදම් භාණ්ඩාගාර ශේෂ සමග සසඳමින් අදාල ගිණුම් සකස් කර ඇති බව |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **හානි පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | අලාභ හානි ලේඛනයක් පවත්වාගෙන ගියද එය යාවත්කාලීන කර නැති බව හා දැනට යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව. |
| (ආ) | **බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | දැනට ක්‍රියාත්මක CIGAS පරිගණක වැඩසටහන යටතේ සියළුම වවුචර්පත් මුල් අදියරේදී බැරකම් ලෙස (Commitments) ඇතුලත් කර ගෙවීම් කිරීම සඳහා කටයුතු සිදු කරනු ලබන බව හා අවශ්‍ය අවස්ථාවකදී පවත්නා බැරකම් පිළිබඳ ලැයිස්තුවක් |

| | | |
|---|---|---|
| | | CIGAS මගින් නිර්මාණය කර ලබා ගත හැකි බව. ඒ අනුව මූලික වශයෙන් පවත්නා ගෙවීම් දෛනික බැරකම් පරික්ෂා කිරීමට හැකි වන පරිදි භෞතික වශයෙන් බැරකම් ලේඛණයක් පවත්වාගෙන යාමක් සිදු නොවන බව |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව වැය ශීර්ෂ යටතේ සලසන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් පිළිබඳ නියැදි පරික්ෂාවේදී දක්වා ඇති හේතු විගණනයට පිළිගත නොහැකි අවස්ථා 11 ක් පැවති අතර එම ඉතිරිකිරීම් සියයට 100 සිට සියයට 35 ක පරාසයක් දක්වා පැතිර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | කොරෝනා ව්‍යසනය මත වෙනත් වර්ෂවල මෙන් නොව මෙම වර්ෂයේදී සැලසුම් කළ පරිදි කාර්යාල කටයුතු සුමටව පවත්වාගෙන යාම, නව ව්‍යාපෘති ආරම්භ කිරීම, පවත්නා ව්‍යාපෘතින් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම පොදුවේ ගත් කල කාලය ප්‍රමාණවත් නොවීම හා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම ඉතිරිවීම් සඳහා හේතු වී ඇති බව. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් ලෙස රු.57,028,465 ක් දක්වා තිබූ අතර භාණ්ඩාගාර මුද්‍රිතය අනුව එය රු.252,454,006ක් විය. ඒ අනුව රු.195,425,541ක් අඩුවෙන් බැරකම් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කළ යුතු අතර ආයතනයේ තැන්පත් භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සැසඳිය යුතුය. | සත්‍ය වශයෙන්ම තව දුරටත් එවැනි බැරකමක් ගෙවීම් කිරීම සඳහා නොපවතින බැවින් ඒ බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ තව දුරටත් කටයුතු කර අදාල බැරකම් වටිනාකම අවසාන ගිණුමෙහි දක්වා ඇති සත්‍ය බැරකම් වටිනාකමට භාණ්ඩාගාර ශේෂය සංශෝධනය කිරීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී 2020 වර්ෂය වෙනුවෙන් දරණ ලද රු.1,755,530ක වටිනාකම බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | වෙනත් ආයතන වෙනුවෙන් පවතින බැරකම් සියල්ල බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ දැක්විය යුතුය. | මෙම ලැයිස්තුවේ සඳහන් බොහෝ ගෙවීම් විදුලිය, ජලය හා තැපැල් විදුලි සංදේශ සේවාවන් වෙනුවෙන් 2020 වර්ෂයේ අවසාන කාලය සඳහා දරණ ලද අත්‍යාවශ්‍ය වියදම් වන අතර මු.රෙ. 115 ප්‍රකාරව 2021 මාර්තු 31 දක්වා අදාල වියදම් පියවීමේ හැකියාව මත මෙම ගෙවීම් සිදු කර ඇති බව. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104(1)-104 (4) | 2019 හා 2020 වර්ෂයන්හිදී අලාභයන් සිදුවූ වාහන අනතුරු පිළිවෙලින් 08 ක් හා 01ක් සම්බන්ධයෙන් පරීක්ෂණ නිලධාරින් පත්කර තිබුණද මෙතෙක් කිසිදු වාර්තාවක් ලබා දී නොතිබුණි. එසේම 2020 වර්ෂයේදී වාහන අනතුරු 05 කට සිදුවූ අලාභ සම්බන්ධයෙන් කිසිදු නිලධාරියකු 2021 මාර්තු 31 දින තෙක් පත්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට මු.රෙ. 104 පරීක්ෂණ සඳහා කමිටු 6ක් පත් කර ඒ අනුව රාජකාරි පවරා ඇති බව හා ඉදිරියේදී මෙම තත්වයන් වළක්වා ගැනීම සඳහා සැලසුම් සහගත වැඩ පිළිවෙලක් සකස් කරන බව. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් හෝ එන්ජිමට සම්බන්ධ අළුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වූවත් චක්‍රලේඛය නිකුත් කළ දින සිට මෙතෙක් එසේ කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි වූ අතර මේ වන විට පරීක්ෂා කිරීම ආරම්භ කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ii)2009 ජුනි 17 දිනැති අංක 9/2009 (1) දරණ චක්‍රලේඛය | අමාත්‍ය කාර්ය මණ්ඩලය තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මගින් සනාථ කිරීම කළ යුතු බව සඳහන් වුවද අමාත්‍ය කාර්ය මණ්ඩලය එසේ කර තිබූ බවට විගණනයට තොරතුරු අනාවරණය නොවීය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් හට ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සටහන් තබන ලෙසට මේ වන විට උපදෙස් ලබා දී ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර 32හි ඉඩම් කට්ටි **(Plots)** 913 ක් පැවති අතර අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ඉන් 627 ක විවිධ ආයෝජනවල නිරත ආයෝජකයින්ගේ කර්මාන්තද, පොදු පහසුකම් සඳහා 104ක්ද, ආයෝජකයින්ට ලබා දීමට යෝජිත භූමි 66 ක්ද වූ අතර ඉඩම් කට්ටි **(Plots)** 118 ක් එනම්, මුළු ඉඩම් කට්ටි වලින් සියයට 13ක ප්‍රමාණයක් කර්මාන්තකරුවන්ට ලබා නොදී නිශ්කාර්යව පැවතුණි. | සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත ආරම්භ කරවීමට කටයුතු කළ යුතුය. | 2020.01.24 දින කර්මාන්තපුරවල පවතින හිස් ඉඩම් කට්ටි පිළිබඳව භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් 03ක දැන්වීමක් පළ කරන ලද බව හා ඒ මේ වන විට ඉඩම් කට්ටි 62ක් ලබා දී ඇත.<br>මේ වන විට කර්මාන්ත පුරයන්හි පවතින්නේ හිස් ඉඩම් කට්ටි 73ක් පමණක් වන අතර, එම ඉඩම් කට්ටි වලින් බහුතරයක් පවතින්නේ උතුරු හා නැගෙනහිර පළාත් වලට අයත් කර්මාන්ත පුරවල වේ. මෙම කර්මාන්තපුර සඳහාද ඉල්ලීම් වර්ධනය වෙමින් පවතී. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය සතු වාහන 05 ක් වර්ෂ 1-3 අතර කාල පරාසයක සිට අළුත්වැඩියා කිරීමකින් තොරව නිශ්කාර්යව පැවතිණි. මෙම වාහන 05 තුල 2012, 2013, 2014 වර්ෂවල මිලදී ගත් මෝටර් රථ 03 ක්ද ඇතුලත් විය. | කඩිනමින් අළුත්වැඩියාවට යොමුකළ යුතු අතර නවීන වාහන පරික්ෂාකාරීව භාවිතා කළ යුතුය. | ඇස්තමේන්තුව රක්ෂණ ආයතනය මගින් අනුමත නොකිරීම, ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොතිබීම, Covid 19 තත්ත්වය ආයතන වැසීමට සිදුවීම ආදී කරුණු හේතු වී ඇති බව හා අවුරුදු 10ක් ගතවීමටත් පෙර වාහන අක්‍රීය වීම සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස 2021.04.07 දිනැති ලිපියෙන් යාන්ත්‍රික ඉංජිනේරු වෙත දන්වා ඇති බව |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මු.රෙ.106 හා මු.රෙ.113 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ 2019 වර්ෂයේදී සිදු වූ සිද්ධි 9කට අදාළව මෙතෙක් අයකරගෙන නොමැති වටිනාකම රු.3,787,120ක් තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | වර්ෂය අවසානයට පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ අයකර නොගත් සියළු පාඩු අනාවරණය කළ යුතුය. | 2019 වර්ෂයේ සිදුවූ වාහන හදිසි අනතුරු සම්බන්ධව සකස් කර ඇති හානි පාඩු ලේඛනයේ සඳහන් සිද්ධි 09කට අදාළ ඇස්තමේන්තු අගයන්හි එකතුව රු.3, 787,120කි. ඒ අතරින් PD- 6293 වාහනයේ ඇස්තමේන්තුව රු.3,227,231ක් වන අතර රක්ෂණ වන්දි අනුමත කිරීමේ ප්‍රමාදය හේතුවෙන් මේ දක්වා වාහනය අළුත්වැඩියා කර නොමැති බව හා. අනෙක් වාහන අළුත්වැඩියා කර ධාවනයට යොදවා ඇති බව |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නංවමු ලංකා ජාතික වැඩසටහන යටතේ විරැකියාව දිළිඳුකම වැනි උචිත නිර්ණායක පදනම් කරගනිමින් දිවයිනේ සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් තෝරා පුහුණු වැඩ සටහන් පවත්වා ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අවශ්‍ය භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මිලදී ගෙන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂකට භාරදීමෙන් පසු නියෝජ්‍ය අධ්‍යක්ෂක මෙම වැඩසටහනට සම්බන්ධ අනෙකුත් ආයතන හා එක්ව එම භාණ්ඩ ප්‍රතිලාභීන්ට බෙදාහැරිය යුතු විය. එහෙත් පරිපාලන, පුහුණු | මෙතෙක් බෙදා නොහැර පවතින මෙම භාන්ඩ කඩිනමින් ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමට කටයුතු කළ යුතුය. | 2019 අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණද 2019 ජනාධිපතිවරණයෙන් පසු මෙම වැඩසටහනට අදාල මිලදී ගැනීම් කටයුතු සිදු කරන මෙන් දන්වා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 2019/12/03 දින ලිපි යවන ලද නමුත් මුදල් අමාත්‍යාංශය වෙතින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කරන සියළුම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා 2019/11/20 දිනැතිව **BD/GPS**155/09/01/**HA/**2019 අංක දරණ ලිපිය දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කොට තිබුණි. බදුල්ල, මහනුවර සහ මාතලේ යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් පමණක් මිලදී ගැනීම් කටයුතු නිම කොට තිබුණි. කෙසේ වුවද මෙම මිලදී ගනු ලැබූ භාණ්ඩ අංක |

| | | | |
|---|---|---|---|
| | හා වෙනත් වියදම් ලෙස රු.16,772,403ක් වැයකර දිවයින පුරා පුහුණු වැඩසටහන් පවත්වා බදුල්ල, මාතලේ හා මහනුවර දිස්ත්‍රික් ප්‍රතිලාභීන්ට බෙදාහැරීම සඳහා 2019 අග හා 2020 මාර්තු මසට පෙර මිලදී ගත් රු.මි.55.8 ක් වටිනා භාණ්ඩ කාර්මික සංවර්ධන මණ්ඩල ප්‍රධාන කාර්යාලයට රැගෙනවිත් වසරක වැඩිකාලයක් ගතවී තිබුණද ඒවා ප්‍රතිලාභීන් වෙත බෙදාහැර නොතිබුණි. ඒවායේ වගකීම් කාලයද ඉක්මවමින් ගබඩා කිහිපයක අපිළිවෙලකට ගොඩගසා නිශ්කාර්යව රඳවා තිබුණි. | | 2021/12 දරණ හා 2021.03.26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් වඩා සුදුසු ව්‍යවසායකයින් වෙත අදාළ උපකරණ බෙදා දීමට සැලසුම්කර ඇති බව. |
| (ආ) | අමප/16/1424/723/039 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (CERA) ආරම්භ කිරීමට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමට රු.මිලියන 120 ක් පමණ වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා කාලයට මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද සමාගමක් වශයෙන් ලියාපදිංචි කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙම ව්‍යාපාරයේ | වැය කළ මුදල නිශ්කාර්ය වීමට නොදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමට කටයුතු කළ යුතුය. | මෙම ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශය යටතේ පැවතුණේ 2016 වර්ෂයේ සිටය. 2016 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් මාසය වන තෙක් අප අමාත්‍යාංශය විසින් කටයුතු කළ නමුත් 2018.11.04 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් මෙම ව්‍යාපෘතිය සමුපකාර හා ආයෝජන වෙළඳ අමාත්‍යාංශයේ විෂය පථයට පැවරු බැවින් අපගේ විෂය පථයෙන් ඉවත් විය. 2018.12.25 දින නැවත මෙම අමාත්‍යාංශය වෙත බාර දෙන ලදී. නමුත් නැවත 2018.12.28 දින අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශයේ විෂය පථයට පැවරුනු බැවින් අප සතු සියළු ලිපි ලේඛන ඉදිරි කටයුතු එම අමාත්‍යාංශය වෙත යොමුකරන ලද අතර ඒ වන විට මෙම ව්‍යාපෘතියේ අසම්පූර්ණ වූ ක්‍රියාකාරකම් ඉටුකිරීමට **CERA** ව්‍යාපෘතිය නැවත අප අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා 2019.03.07 වන දින ජනාධිපති ලේකම් වෙත ඉල්ලීමක්ද ඉදිරිපත් කරනු ලැබීය. |

අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 28 දිනැති 2013 /14 දරණ ගැසට් පත්‍රය මඟින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර නැවත 2020 අගෝස්තු සිට කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. තත්ත්වය එසේ තිබිය දී 2020 නොවැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 20/1725/320/025 පරිදි ව්‍යාපෘතියට අදාල යන්ත්‍රෝපකරණ කොළඹ 10, ට්‍රේස් සිටි වෙත ගෙන යාමට තීරණය කර තිබුණි.

2020.09.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් නැවත කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථයට යොමුකර ඇත. නැවත 2020.09.25 දින **CERA** ආයතනය මෙම අමාත්‍යාංශයට පැවරුණු පසුව ගරු අමාත්‍යතුමා විසින් මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මහා භාණ්ඩාගාරය යටතේ සීමාසහිත සමාගමක් ලෙස **CERA** ආයතනය ස්ථාපනය කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගත් ගොඩනැගිල්ල භාවිතයට නොගෙන පැවතුන බැවින් හා මොරටුව විශ්වවිද්‍යාලයට ආසන්න බැවින් තෝරාගෙන ඇත. කෙසේ වුවද මෙය ස්වාධීන ව්‍යාපෘතියක් ලෙස විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සඳහා සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය **(COSTI)** යටතේ ක්‍රියාත්මක කර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය පරිශ්‍රය තුල ඇති ගොඩනැගිලි පමණක් යොදවා ඇත. අදාල මෘදුකාංග සඳහා රහස් පද යොදා ගෙන ඇතිමුත් ඒවා **COSTI** ආයතනය සතුව පවතින බැවින් ඒවා භාවිතයට ගත නොහැකිව පවතින බව නිවැරදි නොවේ.

අංක අමප/20/1725/320/025 දරණ 2020.12.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව **CERA** ආයතනය ස්වාධිනව සංවර්ධනය වීමේ අරමුණින් කාර්මික සංවර්ධන මණ්ඩල පරිශ්‍රයේ සිට **Trace City (**ට්‍රේස් සිටි**)** වෙත **CERA** ආයතනය ගෙන යාම අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත. නවීකරණය කරන ලද ගොඩනැගිලි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සිය කටයුතු සඳහා භාවිතා කළ හැකි බව.

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 12ක් ද්විතීය මට්ටමේ පුරප්පාඩු 34 ක් තෘතීය මට්ටමේ පුරප්පාඩු 02ක් ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 12ක් සමඟ මුළු පුරප්පාඩු 60 ක් පැවතිණි. අමාත්‍යාංශයේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට අවශ්‍ය වන්නා වූ කාර්ය මණ්ඩලය හඳුනාගෙන එම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය. | මෙම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතීය මට්ටමේ හා ද්විතීය මට්ටමේ පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දන්වා ඇති අතර අවශ්‍ය නොවන තනතුරු ඉවත් කර කාර්ය මණ්ඩලය අනුමත කරන ලෙස මගේ අංක **MIC/ADM/**03/**Cadre** හා 2020.09.11 දිනැති ලිපියෙන් හා 2021.01.06 දිනැති ලිපියෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත සවිස්තරාත්මකව දන්වා ඇත. මෙතෙක් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අදාල අනුමැතිය ලබා දී නැති බව. |
| (ආ) 2020 ඔක්තෝබර් 06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පවරන ලද ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සඳහා අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 277 දෙනෙකු ලබා දී ඇත. කෙසේ වුවද මෙම නිලධාරීන් සඳහා අමාත්‍යාංශය විසින් වැටුප් හා වේතන ගෙවුවද අමාත්‍යාංශයේ හා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය තුල මෙම කාර්යය මණ්ඩලය ඇතුලත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ හෝ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලයට මෙම සංවර්ධන නිලධාරීන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, 2020.10.06 දිනැති අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාශයට පවරා ඇත. ඒ අනුව එම ආයතනයට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් 277ක් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත වී ඇත. මෙම තනතුරු ද කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා ඇතුලත් කරන ලෙස මගේ අංක **MIC/ADM/**12/04/06 හා 2020.12.10 දිනැති ලිපියෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට දන්වා ඇත. එම ආයතනයට අනුයුක්තව සේවය යෙදවීමට තවත් තනතුරු 82ක් අනුමත කර දෙන ලෙස එකී ලිපිය මඟින් ඉල්ලා ඇත. |